NALANDA COLLEGE NALANDA COLLEGE NALANDA COLLEGE

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**07 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 15 - පස**

## A කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) වැලි අංශු වැඩිපුර ඇති පස් වර්ගය නම්,
1) මැටි පස 2) ලෝම පස 3) වැලි පස 4) පාෂාණ

(2) පසෙහි අඩංගු ඝන සංඝටකවලට අයත් වන්නේ,
1) පාංශු ජලය හා පාංශු වාතය
2) පාංශු ජලය හා පාංශු ඛණිජ
3) පාංශු ඛණිජ හා පාංශු ජීවීන්
4) පාංශු ඛණිජ හා පාංශු කාබනික ද්‍රව්‍ය

(3) වාතය අඩුවෙන්ම රඳා පවතින පස වන්නේ,
1) වැලි පසය 2) මැටි පසය 3) ලෝම පසය 4) හියුමස් ය

(4) හියුමස් සෑදී ඇත්තේ,
1) දිරාගිය සත්ත්ව කොටස් වලිනි.
2) දිරාගිය ශාක හා සත්ත්ව කොටස් වලිනි.
3) මැටි පස් හා ඓන්ද්‍රිය ද්‍රව්‍ය වලිනි.
4) වැලි වලිනි

(5) පසේ ජීවත් නොවන ජීවියෙකි.
1) පත්තෑයා 2) වේයා 3) හැකරැල්ලා 4) ඇහැටුල්ලා

(6) ගොඩනැගිලි සෑදීමට සුදුසු පස් වර්ගය වන්නේ,
1) මැටි පස 2) වැලි පස 3) ලෝම පස 4) රොන්මඩ

(7) පසක් ඇඟිලි තුඩු වලින් පරීක්ෂා කිරීමෙන් හඳුනාගත හැකි ගති ලක්ෂණය වන්නේ, පසේ,
1) ව්‍යුහය 2) වයනය 3) සංයුතිය 4) ජලය

(8) වගා කටයුතු සඳහා ඉතා සුදුසු පස වන්නේ,
1) මැටි පස 2) වැලි පස 3) බොරලු පස 4) ලෝම පස

(9) සිනිඳු වයනයකින් යුක්ත, තරමින් මධ්‍යස්ථ අංශු වන්නේ,
1) රොන් මඩ 2) මැටි 3) වැලි 4) හියුමස්

(10) පාංශු කාබනික ද්‍රව්‍ය වල කාර්යයක් නොවන්නේ,
1) පස තුල ජලය රඳවා ගැනීම.
2) පස තුල වාතය රඳවා ගැනීම.
3) වියළි කාලයේදී පස ඉරිතැලීම වැළැක්වීම.
4) පස තුළ උෂ්ණත්වය පාලනය කිරීම.

## B කොටස

(1)




i) ඉහත රූපයේ දක්වා ඇත්තේ පසෙහි අඩංගු සංඝටක වෙන් කිරීම සඳහා සකස් කරගත් ඇටවුමකි. එහි සඳහන් A, B, C, D, E කොටස් නම් කරන්න.

ii) පසෙහි විවිධ ස්තර නිරූපනය වනසේ ලබා ගත් පෘථිවි කබොලේ සිරස් කඩක් රූපයේ දක්වා ඇත.




1) එහි P හා Q ස්ථර නම් කරන්න.
2) මෙයට ලබාදිය හැකි නම කුමක් ද?
3) Q ස්ථරයේ සිට ක්‍රමයෙන් ඉහළට යන විට පස් අංශු වල තරම ක්‍රමයෙන් කුඩාවේ ද? විශාලවේ ද?
4) ඉහත ස්තර වලින් ශාක වැවීමට සුදුසු පස පිහිටන්නේ කුමන ස්තරයේ ද?

(2) පරීක්ෂණ නල 02 ක්, කිරි, පුලුන්, පස් ස්වල්පයක් යොදා ගෙන පහත රූපයේ පරිදි ඇටවුමක් සකස් කරන ලදී.




i) ඉන්පසු පැයෙන් පැයට පරීක්ෂණ නල දෙක නිරීක්ෂණය කරන ලදී. එහිදී ඔබට ලැබෙන නිරීක්ෂණය කුමක් ද?

ii) නිගමනය කුමක් ද?

iii) පසෙහි සිටින ක්ෂුද්‍ර ජීවීන් දෙදෙනෙක් නම් කරන්න.

iv) ඉහත පරීක්ෂණයේ පරීක්ෂණ නල 2 ට පුලුන් ඇබ සවි කිරීමේ අරමුණ කුමක් ද?

(3) අ)




i) දහන නලයකට පස් ස්වල්පයක් දමා රත් කරන ලදී. මෙම පරීක්ෂණය සිදු කිරීමේ අරමුණ කුමක් ද?

ii) මෙහිදී ඔබට ලැබුණු නිරීක්ෂණයක් ලියන්න.

iii) මෙහිදී පිටවන ද්‍රව්‍ය හඳුනාගන්නේ කෙසේද?

ආ) i) පාංශු ඛාදනය යනු කුමක් ද?

ii) පාංශු ඛාදනයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු 2 ක් සඳහන් කරන්න.

iii) බෑවුම් සහිත ඉඩමක පාංශු ඛාදනය අවම කිරීමට යොදා ගත හැකි උපක්‍රම 2 ක් ලියන්න.

සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය